වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2023

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය

அங்கவீனமுற்ற நபர்களுக்கான தேசிய செயலகம்

NATIONAL SECRETARIAT FOR PERSONS WITH DISABILITIES

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு

MINISTRY OF WOMEN, CHILD AFFAIRS & SOCIAL EMPOWERMENT

පටුන

පටුන..... 1

පූර්විකාව..... 2

විධායක සාරාංශය..... 3

හැඳින්වීම..... 4

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

දැක්ම සහ මෙහෙවර..... 5

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සංයුතිය 6

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

සංවිධාන ව්‍යුහය..... 7

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ පණිවුඩය..... 8

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ

අධ්‍යක්ෂකගේ වාර්තාව ..... 9 - 14

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති.....15-18

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් 19-21

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 22

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්..... 23-25

ජනල් සටහන්..... 26 – 27

විගණකාධිපතිගේ වාර්තාව ..... 28 – 34

විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු..... 35 - 41

පූර්විකාව

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් ද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීමේ දැක්ම පෙරදැරිව 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරිම, අභිසංවර්ධනය, ආරක්ෂා කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම, මාර්ගෝපදේශකත්වය, සම්බන්ධීකරණය, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වේ.

2023 වර්ෂයේ දී සියලුම ආබාධ සහිත ප්‍රජාවගේ සුභසාධනය, අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කර ගැනීමේලා ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්වල කාර්යය සාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම මෙම වාර්ෂික වාර්තාවේ අරමුණවේ.

විධායක සාරාංශය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් ආබාධිත ප්‍රජාව සඳහා 2023 වර්ෂයේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. රටේ පැවති ආර්ථික අර්බුදය හේතු කොටගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වුවත් 2023 වර්ෂය සඳහා සැලසුම් කරන ලද වැඩසටහන්වල ළඟාකරගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% කි.

ආබාධිත ප්‍රජාවගේ සුබසාධන හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය මුල්කරගෙන ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති අතුරින් රටේ පැවති ආර්ථික අර්බුදය හේතු කොටගෙන ජීවනාධාර වැඩසටහනට හා වකුගඩු රෝගීන් සඳහා දෙනු ලබන ජීවනාධාර වැඩසටහන සඳහා සුවිශේෂී ස්ථානයක් හිමිවිය. රුපියල් පන්දහසේ නිත්‍ය දීමනාවට අමතරව රුපියල් දෙදහස් පන්සීයක අමතර දීමනාවක් හා පොරොත්තු ලේඛනගත තැනැත්තන් සඳහා රුපියල් පන්දහසක දීමනාවක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන තුළින් ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින අඩු ආදායම්ලාභී ආබාධ සහිත නිත්‍ය දීමනාලාභීන් 72,000 ක් අතිරේක දීමනාලභීන් 17,882 ක් හා පොරොත්තු ලේඛනගත දීමනාලාභීන් 16139 දෙනෙකුට හා අඩු ආදායම්ලාභී වකුගඩු රෝගී නිත්‍ය දීමනාලාභීන් 39,150 දෙනෙකුට අතිරේක දීමනාලාභීන් 18159 හා පොරොත්තු ලේඛනගත දීමනාලාභීන් 1924 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දෙන ලදී.

මෙම භාරධුර කාර්යය සාර්ථක කර ගැනීම සඳහා සමාජ සවිබලගැන්වීමේ රාජ්‍ය අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම මෙන්ම අමාත්‍ය කාර්යය මණ්ඩලයේ සහයෝගයද ඉතා අගය කළ යුතුව ඇත.

එමෙන්ම කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් හා මඟ පෙන්වීමත්, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි විෂය සම්බන්ධ රාජකාරී ආවරණය කරන සියලුම සමාජ සේවා නිලධාරීන් ඇතුළු සමස්ත ක්‍රියාවලියට දායක වූ සියලුම නිලධාරීන්ට විශේෂ ස්තූතිය හිමිවිය යුතුය.

හැඳින්වීම

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අදාළ විධිවිධාන සැලැස්වීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවක් හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය පිහිටුවා ඇත. ඒ අනුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා හිතකර පරිසරයක් සකස් කිරීම උදෙසා ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ඔවුන්ගේ සුභසාධනය ඇතුළු සහන සැලසීමේ අරමුණින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යලය ක්‍රියා කරනු ලැබේ.

2023 වර්ෂයේ දී ආබාධ සහිත තැනැත්තන් උදෙසා අවශ්‍ය නීති සම්පාදනය කිරීම මෙන්ම සුභසාධනය, පුනරුත්තාපනය හා සවිබලගැන්වීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී . වර්තමාන සමාජ අවශ්‍යතා හඳුනාගෙන ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සාධාරණයක් ඉටු කිරීම සඳහා 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත නැවත සංශෝධන කිරීම, සංඥා භාෂා පනත කෙටුම්පත් කිරීම, ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතිවලට හා පිරිවිතරවලට අනුව ප්‍රවේශ නියෝගවලට අදාළව පවතින ගැසට් පත්‍රය කෙටුම්පත් කිරීම මෙන්ම අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැනැත්තන් සඳහා ජීවනාධාර දීමනා, වකුගඩු ආධාර දීමනා, වෛද්‍යාධාර, අධ්‍යාපන ආධාර, ආධාරක උපකරණ, නිවාස ආධාර, ස්වයං රැකියා ආධාර ලබා දීම හා ආබාධ සහිත තැනැත්තන් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යොමු කිරීම, හැකියා වර්ධන වැඩසටහන්, ආයතන සංවර්ධන වැඩසටහන් වැනි වැඩසටහන්වලට අමතරව ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ රජයේ ලියාපදිංචි ආබාධ සහිත වූවන්ට සේවා සපයන ආයතන සංවර්ධනය කිරීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම හා වියලි ආහාර ද්‍රව්‍ය ලබාදීම, ආබාධ සහිත ළමුන් හා අඩුපහසුකම් සහිත ළමුන් සඳහා රු.15,000 ක් වටිනා පාසල් උපකරණ ලබාදීම හා මනස නිරවුල් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ආබාධිතභාවයට අනුව ස්වයං රැකියා සඳහා වෙළඳ කරත්ත ලබාදීම, ආබාධ සහිත පුද්ගලයන් සවිබලගැන්වීමේ වැඩසටහන සහ ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින් දැනුවත් කිරීම් වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

එමඟින් ආබාධ සහිත තැනැත්තන් සවිබලගැන්වීම තුළින් ඔවුන් රටේ සම්පත් බවට පත්කර දළ ජාතික නිෂ්පාදනයේ හවුල්කරුවන් කරගැනීමත් ආබාධ සහිත තැනැත්තන් කෙරෙහි සමාජයේ පවතින සාම්ප්‍රදායික, පසුගාමී ආකල්ප වෙනස්කර ආබාධ සහිත තැනැත්තන් ද අනෙක්

පුරවැසියන් මෙන් සම අයිතිවාසිකම් හිම අය බවට පත්කිරීමටත් ඒ සඳහා ඔවුන්ට අවස්ථාව ලබා දී අභිමානවත් ජීවන තත්ත්වයක් උදාකරලීමත් අපගේ අභිලාෂය වේ.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය
1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ
අයිතිවාසිකම් පනතේ නෛතික ප්‍රතිපාදනවලට යටත්ව
ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ
ජාතික මහ ලේකම් කාර්යාලය ස්ථාපිත කොට ඇත.


දැක්ම

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් ද ජාතික සංවර්ධනයේ කොටස්කරුවන් බවට පත් කිරීම.


මෙහෙවර

මාර්ගෝපදේශකත්වය, සම්බන්ධීකරණය, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම තුළින් ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා සුරක්ෂිතභාවය සහතික කිරීම.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපතිගේ පණිවුඩය

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම යන කරුණු සලකා 1996 අංක 28 දරන පනත යටතේ ආබාධ සහිත තැනැත්තන් උදෙසා මෙම කටයුතු ක්‍රියාවට නැංවීමේ අරමුණින් ජාතික සභාවක් මෙම අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇත. මෙම පනතේ අඩංගු බලතල ප්‍රකාරව මෙකී ජාතික සභාව මගින් ගනු ලබන තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මගින් මෙම ප්‍රජාවගේ සියලුම සුභසාධන කටයුතු මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරභයා ගනු ලබන සියළුම ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්ති සකස් කිරීම හා මාර්ගෝපදේශනය ලබාදීම ආදිය සිදු කරනු ලබයි.

මේ අතර ශ්‍රී ලංකා රජය මගින් අත්සන් තබන ලද ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සඳහා වන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ක්‍රියාවට නැංවීමේ කාර්යභාරය අපවෙත ඇති ප්‍රධානම අභියෝගය ලෙස දකිමි. එමෙන්ම මෙම ප්‍රජාව සවිබලගැන්වීම ඔවුන් වෙත ලබාදෙන සියළුම සුභසාධන දීමනාවලට වඩා ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකමි. මෙහිදී ඔවුන් සඳහා නිසි අධ්‍යාපනය, මාර්ග පහසුකම් හා සුදුසු රැකියා සඳහා යොමු කිරීම, සෞඛ්‍ය පහසුකම් යන කරුණු සඳහා මූලිකත්වය ලබාදීම තුළින් මෙම ප්‍රජාව සවිබලගැන්වීමට පහසු වනු ඇත.

2023 වර්ෂයේ දී විෂයභාර අමාත්‍යවරයා ලෙස මෙම ප්‍රජාව වෙනුවෙන් මා හට විශාල මෙහෙයක් ඉටු කිරීමට හැකිවීම මා ලද භාග්‍යයක් කොට සිතමි. එනම් ආබාධිත අයගේ අයිතිවාසිකම් පිළිබඳ නිවියෝක් හි පැවති එක්සත් ජාතින්ගේ 16 වැනි සැසිවාරයට සහභාගිවීමත් ඒ තුලින් අපගේ රටේ මෙම වැඩපිලිවෙල ක්‍රියාත්මක කිරීම සාර්ථක කරගැනීම පිළිබඳ ඔවුන්ගේ අවධානය දිනාගැනීමට හැකිවීමත්ය. ඒ තුළින් ඉදිරි වසර පහක් සඳහා ලංකාව තුළ සාර්ථක වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීමේ මූලික අඩිතාලම දැමීම වෙනුවෙන් අවශ්‍ය වූ මූල්‍ය හා තාක්ෂණික ප්‍රතිපාදන ලබාගැනීමට හැකිවීමත් විශාල ජයග්‍රහණයක් ලෙස මා දකිමි.

ආබාධිත ප්‍රජාව අතුරින් 70% කට වැඩි ප්‍රමාණයක් සවිබලගැන්වීය හැකි ප්‍රජාව ලෙස වාර්තාවල සඳහන් වුවද ඒ පිළිබඳ ක්‍රමවත් වැඩපිළිවෙලක් දියත් කිරීමට තවමත් රටක් ලෙස අපහට නොහැකි වී තිබීම කණගාටුවට කරුණකි. මේ සඳහා මා අවබෝධකරගත් කරුණ නම් මේ අයගේ නොහැකියාව නොව හැකියාව මතුකර ගැනීමට උපකාර කළ යුතු බවයි. ඒ සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රාථමික, ද්විතියික, තෘතියික අධ්‍යාපන අවස්ථා විවර කරදීම හා එම ක්ෂේත්‍රවල සියලුම නිලධාරීන් හා පරිපාලනය මේ පිළිබඳව මනා දැනුමින් පරිපූර්ණ කළ යුතුය. එමෙන්ම ඒ වෙනුවෙන් ක්‍රියාවට නංවනු ලබන වැඩපිළිවෙලක් තිබිය යුතුය. රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන සියල්ලක්මද, ප්‍රවාහන සේවා සපයන ආයතනද, නාගරික සංවර්ධනයට අදාළ සියලුම ආයතන, මාර්ග සංවර්ධනය, පළාත් පාලන ආදිය මෙම අයගේ ප්‍රවේශ පහසුකම් උදෙසා පෙලගැස්විය යුතුය. රටට සම්පතක් කරගත හැකි මෙම ප්‍රජාව, සවිබලගැන්වීම සඳහා අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග කෙරෙහි යොමුවෙමින් පවතින මෙම මොහොතේ එම කටයුතු සාර්ථක කරගැනීම සඳහා ප්‍රධාන වගකීම දරන ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත් එමෙන්ම පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානත් තම කාලය හා ශ්‍රමය වැය කරමින් ආබාධිත ප්‍රජාවගේ උන්නතිය වෙනුවෙන් කරන මෙහෙය අගය කරන අතර මගේ කෘතඥතාවය ද ඔවුන් වෙත පුදකර සිටිමි.

අනූප පස්කුවල්
රාජ්‍ය අමාත්‍ය සමාජ සවිබලගැන්වීම්

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
සභාපති, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ වාර්තාව

රජයේ ප්‍රතිපත්ති, තීන්දු තීරණයන්ට අනුකූලව ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ ප්‍රතිපත්තිමය තීරණය හා නිශ්චය කරන ලද ක්‍රියාමාර්ග අනුව කටයුතු කරමින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය විසින් 2023 වර්ෂයේ අත්කරගත් කාර්ය සාධනය පිළිබඳ තොරතුරු සැකවින් පහත දැක්වේ. මෙම වර්ෂය තුළ රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ පැනනැගි අභියෝගාත්මක තත්ත්වයක් යටතේ වුවද ඉතා ඉහළ කාර්යය සාධනයක් ළඟා කර ගැනීමට හැකිවිය.

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නව පනත් කෙටුම්පත

මෙම පනත වර්තමාන සමාජ රටාවට අනුරූප වෙමින් ආබාධ සහිත ප්‍රජාව වෙනුවෙන් උපරිම සාධාරණයක් ඉටු කිරීම සඳහා නැවත සංශෝධන කිරීමේ කටයුතු සිදු කරමින් නව පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

සංඥා භාෂා පනත් කෙටුම්පත

සංඥා භාෂාව පිළිගත් සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ස්ථාපිත කිරීම සඳහා අමාත්‍යාංශයේ නිරීක්ෂණයන්ට අනුකූලව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලද සංඥා භාෂා පනත් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුවේ නිශ්කාශන සහතිකය ලබාගැනීම සඳහා යොමු කොට ඇත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ නියෝග ගැසට් පත්‍රය

රජයේ ගොඩනැඟිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු පිණිස 2006.10.17 හා අංක 1467/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය හා එය සංශෝධනය කරමින් නිකුත් කර ඇති අංක 1619/24 හා 2009.09.18 දින දරන අති විශේෂ ගැසට් නිවේදනය වර්තමානයේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි නැවත සකස් කිරීමට කටයුතු කරමින් පවතී. අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා සංශෝධන සිදු කරමින් පවතී.

රැකවරණ මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම

දීප ව්‍යාප්තව රැකවරණ මධ්‍යස්ථාන 6ක් ඉදි කිරීම සඳහා අමප/18/0755/711/015 අංක දරණ පත්‍රිකාව මඟින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේ වන විට මාතර අකුරැස්ස මධ්‍යස්ථානයෙහි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී. 2024 වර්ෂයේ දී එහි වැඩ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් සඳහා රු.5000/- මාසික ජීවනාධාර දීමනාව ලබා දීම

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2007 වසරේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහන මඟින් ආබාධ සහිත තැනැත්තන් හා ඔවුන්ගේ පවුල් සවිබලගැන්වීම සඳහා කටයුතු කෙරේ. ජීවන මට්ටම උසස් කිරීම, පෝෂණය ඉහළ නැංවීම, මානසික හා සමාජීය තත්ත්වය වැඩිදියුණු කිරීම මෙහි දී හඳුනා ගත හැකිය. 2007 වර්ෂයේ සිට ලබාදුන් රු.3000/- ක ජීවනාධාරය 2019 වසරේ මැයි මස සිට රු.5000/- දක්වා වැඩි කර, 2019 ජූලි මාසයේ සිට 32,000 වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාවට නව ප්‍රතිලාභීන් 40,000ක් එක් කර මුළු පිරිස 72,000 ක් දක්වා වැඩි කිරීමට පියවර ගන්නා ලදී. 2023 වර්ෂයේ දී ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ලබාදෙන මාසික දීමනාව සඳහා රු .මිලියන 5,609.28 ක් වැයකොට නිත්‍ය ප්‍රතිලාභීන් 72,000ක් අතිරේක දීමනාලාභීන් 17,882 ක් හා පොරොත්තු ලේඛනගත දීමනාලාභීන් 16,139ක් සඳහා එම දීමනාව ලබාදීම.

අඩුආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා රු.5000/- මාසික ජීවනාධාර දීමනාව ලබා දීම

මූලය හඳුනා නොගත් කාලික වකුගඩු රෝගීන් සඳහා මාසික දීමනා ගෙවීම 2015 වසරේ සිට ක්‍රියාත්මක වේ. රු.3000/- මාසික ජීවනාධාරයක් වශයෙන් ආරම්භ කරන ලදුව වර්තමානයේ රු.5000/- මාසික ජීවනාධාරයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිර්දේශිත කාලික වකුගඩු රෝග ව්‍යාප්ත දිස්ත්‍රික්ක 11 තුළ හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 84 ක රෝගීන් සඳහා මෙම දීමනාව ගෙවන ලදී. 2020 සැප්තැම්බර් මාසයේ සිට දිවයිනම ආවරණය වන පරිදි, සියලුම වර්ගයේ වකුගඩු රෝගවලින් පෙළෙන ප්‍රතිලාභීන් 39,169ක් සඳහා ගෙවීම් සිදු කිරීමට හැකි විය. 2023 වර්ෂයේ දී වකුගඩු රෝගීන් වෙනුවෙන් ලබාදෙන මාසික දීමනාව ලබාදීම සඳහා රු .මිලියන 2,901.39 ක් වැයකොට

නිත්‍ය ප්‍රතිලාභීන් 39,150ක් අමතර ගෙවීම් 18,159 ක් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් 1,924 ක් සඳහා එම දීමනාව ලබාදීම.

වික්ටෝරියා නිවාසය පවත්වාගෙන යාමට ආධාර ලබා දීම

රාජගිරිය වික්ටෝරියා නිවාසයේ සේවක වැටුප් හා දීමනා, ජල, විදුලි හා දුරකථන බිල්පත් ගෙවීම වෙනුවෙන් මසකට රු.මි. 0.75 බැගින් වර්ෂයට රු.මි. 9 ක මුදලක් ලබාදීමට කටයුතු කර ඇත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබා දීම

රැකියාවක නියැලිය හැකි මට්ටමක සිටින ආබාධ සහිත තැනැත්තන් සඳහා පෞද්ගලික අංශයේ රැකියාවක් සඳහා යොමු කරන අතර, එම ආයතනය ගෙවනු ලබන මූලික වැටුපෙන් 50% (උපරිමය රු.15,000/- ක් වන පරිදි) මාස 24ක් සඳහා මෙම කාර්යාලය මඟින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. රටේ පැවති ආර්ථික අර්බුදය හේතුකොටගෙන පෞද්ගලික අංශයේ නව බඳවා ගැනීම් සීමා සහිත වීමත්, පැවති ආයතන වැසීයාමත් යන අපහසුතා බාධා මධ්‍යයයේ වුවද මෙම වර්ෂය සඳහා රැකියා අවස්ථා 31 ක් ලබාදීමට හැකිවිය.

වෛද්‍ය ආධාර ලබා දීම

රජයේ රෝහලින් නොසපයන ඖෂධ ලබා ගැනීමට,සායනවලට සහභාගී වීම සඳහා හා හෘද, අක්ෂි, වකුගඩු, මොළය, උකුල් ඇට, කර්ණ පටක බද්ධය ආදී ඕනෑම සැත්කමක් සඳහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට අඩු ආදායම්ලාභී පවුල් සඳහා උපරිමය රු.30,000/- ක් දක්වා මේ යටතේ ආධාර ලබාදේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
542	9.74

ආධාරක උපකරණ ලබා දීම

ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය සඳහා උපකාර වෙමින්, අන්තර්කරණ සංවර්ධනයට දායක කර ගැනීමට හා ඔවුන් ස්වාධීන පුද්ගලයන් බවට පත් කිරීම සඳහා අඩු ආදායම්ලාභී පුද්ගලයින්ට ඇස් කණ්ණාඩි, රෝද පුටු, ඇවිදීමේ රාමු, අත්වාරු, කිහිළිකරු ආදිය උපකරණ වශයෙන් ද වායු මෙට්ට,ජල මෙට්ට ආදී විශේෂ උපකරණ සඳහා උපරිම රු.20,000/- දක්වා මුදල් ආධාර ලබාදීම සිදු කෙරේ. ශ්‍රවණ උපකරණ ලබාගැනීම සඳහා රු. 15,000/- සිට රු.35,000/- දක්වා මූල්‍ය ආධාර ලබාදීම සිදුකරයි. අඩු ආදායම් ලබන පුද්ගලයන් සඳහා වෛද්‍ය නිර්දේශ මත මෙම ආධාරය ලබා දේ. මෙම වර්ෂයේ ජංගම සේවා 13 ක් පවත්වා උපකරණ පහත පරිදි බෙදා දී ඇත.

කොමඩ රෝදපුටු	රෝදපුටු	අත්වාරු	කිහිළිකරු	වෝකර්	ඇස්කණ්නාඩි (ළඟ හා දුර)	ඇස් කණ්නාඩි (කියවීම්)	විශේෂ උපකරණ	කෘතිම පාද	විශේෂ සපත්තු
14	65	66	38	24	64	7425	39	22	02

හැකියා වර්ධන වැඩසටහන

ආබාධ සහිත තැනැත්තන්ගේ හා ආබාධ සහිත තැනැත්තන් ඉගෙනුම ලබන විශේෂ අධ්‍යාපන ඒකක සඳහාද ඔවුන්ගේ ක්‍රීඩා, කලා හා සෞන්දර්යාත්මක හැකියාවන් මෙන්ම වෙනත් දක්ෂතා ඔප්නැංවීමේ අරමුණින් රු.50,000/- ක උපරිමයක් දක්වා මූල්‍ය අනුග්‍රහය ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදු කෙරේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ආයතන **05**	0.22

ස්වයං රැකියා ආධාර ලබාදීම

අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල පවතින දරිද්‍රතාවය අවම කිරීම සඳහා ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා එක් පුද්ගලයකුට හෝ පවුලකට උපරිම රු.40,000/- ක් දක්වා ස්වයං රැකියා ආධාර ලබාදීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ප්‍රතිලාභීන් **154**	5.12

අධ්‍යාපන ආධාර ලබා දීම

අඩු ආදායම්ලබන ආබාධ සහිත දරුවන් හා ආබාධ සහිත භාරකරුවන්ගේ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීමේ වැඩසටහනකි. මෙම වැඩසටහන යටතේ එක් වරක් පමණක් උපරිමය රු.20,000 වන පරිදි අධ්‍යාපන උපකරණ ලබා ගැනීම සඳහා ආධාර දෙනු ලැබේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ප්‍රතිලාභීන් **461**	5.37

ස්වේච්ඡා සංවිධාන බලගැන්වීම

මෙම මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි ආයතන 238 ක් පවතින අතර මෙම ආයතන බොහෝමයක් විධිමත් මූල්‍ය ආධාර නොලබන ආයතන වේ. ලැබෙන ඉල්ලීම් අනුව, කෂේත්‍ර පරීක්ෂණ මඟින් තහවුරු කර ගැනීමෙන් පසු එම ආයතනවල භෞතික ඉදිකිරීමක් සඳහා රු.ලක්ෂ දෙකක් දක්වා මූල්‍යාධාර ලබාදීමට මෙම වැඩසටහනින් කටයුතු කෙරේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
ආයතන **02**	0.29

ජාත්‍යන්තර ආබාධිත දිනය සැමරීම

ජාත්‍යන්තර ආබාධිත දිනයට සමගාමීව "ආබාධිත පුද්ගලයින් සඳහා ඔවුන් සමඟ සහ ඔවුන් විසින් තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාකාරීව එක්සත් වේ" තේමාව යටතේ සාකච්ඡාමය වැඩසටහනක් හා ප්‍රවේශ විය හැකි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. මෙම වැඩසටහන සඳහා රු.මි. 1.14 ක පෞද්ගලික අංශයේ ආධාර හා පරිත්‍යාග යොදා ගත් අතර රු. මිලියන 0.47ක් පමණක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් ලබා ගන්නා ලදී.

නිවාස ආධාර ලබාදීම

කිසිම ආදායම් මාර්ගයක් නොමැති, ඉඩමක් සඳහා හිමිකම් ඇති නමුත් නිවසක් අහිමි ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවසක් තනා දීමේ වැඩසටහන 2001 වසරේ සිට ක්‍රියාත්මක කරන අතර, ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා ලොතරැයිය මඟින් ලබන ආදායමින් 5%ක් වාර්ෂිකව මෙම අරමුදල සඳහා වෙන් කිරීමෙන් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගනු ලැබේ.

නව නිවසක් ඉදි කිරීම සඳහා රු.500,000/- ක මුදලක් ද අලුත්වැඩියා කර ගැනීමක් සඳහා 250,000/- ක මුදලක් වාරික වශයෙන් ලබා දේ.

ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මී)
241	22.98

2023 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන හා වියදම් සාරාංශය

	අනුමත ප්‍රතිපාදන **රු.මිලියන**	**වියදම** **රු.මිලියන**
ප්‍රාග්ධන	**34.00**	**34.23 ***
පුනරාවර්ථන	**10818.00**	**8520.26**

*වැඩිපුර වියදම් වූ මුදල එනම් මිලියන **0.23**ක මුදල ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාතික අරමුදලේ ශේෂයෙන් ලබා ගන්නා ලදී.

ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ පහත සඳහන් වැඩසටහන් ද ක්‍රියාත්මක වේ.

- රජයේ ලියාපදිංචි හිමිකම් සහිත ආබාධ සහිත වූවන්ට සේවා සපයන ආයතන සංවර්ධනය කිරීම,
- ආබාධ සහිත තැනැත්තන් සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම හා වියලි ආහාර ද්‍රව්‍ය ලබාදීම,
- ආබාධ සහිත ළමුන් හා අඩුපහසුකම් සහිත ළමුන් සඳහා රු.15,000 ක් වටිනා පාසල් උපකරණ හා මනස නිරවුල් කිරීමේ වැඩසටහන් පැවැත්වීම,
- ආබාධිතභාවයට අනුව ස්වයං රැකියා සඳහා වෙළඳ කරත්ත ලබාදීම,
- ආබාධ සහිත පුද්ගලයන් සවිබලගැන්වීමේ වැඩසටහන,
- ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින් දැනුවත් කිරීම් වැඩසටහන ආදී වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඉදිරි ඉලක්ක

- **1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සංශෝධනය අවසන් කිරීම.**
- **සංඥා භාෂා පනත් කෙටුම්පත අනුමත කර ගැනීම**
- **ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම**
- **ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම**
- **දැනට සංශෝධිත මට්ටමේ පවතින ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ පහසුකම් සැපයීමේ ගැසට් පත්‍රයේ කටයුතු අවසන් කිරීම**
- **අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය ආරම්භ කිරීම**
- **2024 වර්ෂයේ දී ආබාධ සහිත තැනැත්තන් 25 ක් රැකියාගත කිරීම**

ජයමාලි සී වික්‍රමආරච්චි

අධ්‍යක්ෂ

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. ආයතනික තොරතුරු

පොදු

ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය (NSPD) යනු 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත යටතේ 1996 ඔක්තෝබර් 24 වැනි දින ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද ආයතනයකි. NSPD හි ලියාපදිංචි කාර්යාලය බත්තරමුල්ල, සෙත්සිරිපාය II අදියරෙහි 1 වන මහලේ පිහිටා ඇත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය, ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසික ජීවන වියදම් ආධාර, ස්වයං රැකියා ආධාර, අධ්‍යාපන ආධාර, වෛද්‍ය ආධාර වැනි ආධාර සැපයීමේ කාර්යයේ නියැලී සිටී.

මීට අමතරව, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය විසින් CKDU (රෝග මූලය හදුනානොගත් වකුගඩු රෝග) රෝගීන් සඳහා මාසික ආධාර ප්‍රදානය කිරීම NSPD සම්බන්ධීකරණය කරයි.

02. අනුකූලතා ප්‍රකාශය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඇති අතර 1996 අංක 28 දරන ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ අනෙකුත් අවශ්‍යතාවලට අනුකූල වේ.

03. ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

සාමාන්‍ය ප්‍රතිපත්ති

3.1.1 සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, ආසන්නතම රුපියලට වටයා ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වසරවල භාවිත කළ ඒවාට අනුරූපි වන සේ යොදාගෙන ඇත.

3.1.2 සංසන්දනාත්මක තොරතුරු

වර්ථමාන තත්ත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය විටෙක පෙර වසරේ සංඛ්‍යා දත්ත සහ පියවරයන් නැවත සකසා ඇත.

3.1.3 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා සුදුසු අවස්ථාවලදී, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහනෙහි හෙළිදරව් කිරීම් ගැලපීම් සිදු කර ඇත .

3.2 වත්කම් තක්සේරු කිරීම සහ ඒවායේ මිනුම් පදනම

3.2.1 තොගය

යල් පැන ගිය සහ මන්දගාමී අයිතම සඳහා තොගය මනිනු ලබන්නේ හිඟ දීමනා වලින් පසුව, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයටය. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුත්තකදී තොගය අලෙවි කළ හැකි මිලෙන් ඇස්තමේන්තුගත නිම කිරීමේ පිරිවැය සහ එහි ඇස්තමේන්තුගත විකිණුම් පිරිවැය අඩු කළ පසු අගයයි.

තොගය එහි වර්තමාන ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය සහ කොන්දේසි පහත පරිදි ගණන් ගනු ලැබේ- :

පරිභෝජන ද්‍රව්‍ය - ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය (FIFO) මත පදනම්ව සැබෑ පිරිවැය.

3.2.2 මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන, මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දන්නා මුදල් ප්‍රමාණයන් සහ වටිනාකමේ වෙනස්වීම්වල නොසැලකිය යුතු අවදානමකට යටත් වන දේ ලෙස අර්ථ දක්වා ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, මුදල් සහ මුදල් වලට සමාන දෑ අතැති මුදල් සහ බැංකු තැන්පතු ලෙස සලකණු ලැබේ.

3.2.3 දේපල, පිරියත සහ උපකරණ

a) පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ, පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් හානියක් පාඩුවක් හෝ ලාභයක් යටතේ වාර්තා කරනු ලැබේ.

b) ප්‍රතිස්ථාපන පිරිවැය

මුලින් තක්සේරු කරන ලද කාර්ය සාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දේපල, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරන ලද වියදම්, දැරූ විට වියදමක් ලෙස පිළිගැනේ.

c) ක්ෂයවීම්

ක්ෂයවීම් සඳහා වෙන්කිරීමේ ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ වසර ආරම්භයේ පොත්වල පවතින වත්කම්වල අගයෙන් අඩුවන හෝ හීනවන අගයේ ස්ථාවර ප්‍රතිශතයක් ලෙස හීනවන ශේෂ ක්‍රමය භාවිතා කිරීමෙනි. අගය. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිනුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 7 අනුව සෑම වසරකම ක්ෂයවීම් ප්‍රමාණය අඩු වේ.

ගෘහ භාණ්ඩ සහ උපාංග	15%
පරිගණක සහ IT උපකරණ	15%

3.3 වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍රයේ වත්මන් වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත හෝ ශේෂ පත්‍රයේ සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ.

3.3.1 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයට වර්තමාන වගකීමක් (නීතිමය හෝ නිර්මාණාත්මක) ඇති විට වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය වන අතර වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි අවස්ථාවකදී වෙන්කිරීම් පිළිගනු ලැබේ.

3.4 විස්තීරණ ආදායම ප්‍රකාශය

3.4.1 ආදායම් හඳුනාගැනීම

රාජ්‍ය ප්‍රදානයන්

ප්‍රාග්ධනය සඳහා රජයේ ප්‍රදානයන් වෙන වෙනම හඳුනාගෙන ඇත. ප්‍රාග්ධන ප්‍රදානය ප්‍රධාන ආදායම් ප්‍රභවය වන අතර එය ආදායම් ප්‍රකාශයට බැර වේ.

මීට අමතරව, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සුපිරිවාසනා සම්පත අලෙවි කිරීමෙන් ලබන ලාභයෙන් සියයට පහක (5%) ප්‍රතිශතයක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් ආබාධ සහිත පුද්ගලයන් වෙත නිවාස ආධාර ලබාදීම සඳහා ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට ලබා දේ.

3.4.2 වියදම් හඳුනාගැනීම

අ) ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගෙන ඇත්තේ දැරීමට සිදුවන පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතමවල ක්‍රියාත්මක වීම අතර සෘජු සම්බන්ධයක් මත ය; ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්වයෙන් පවත්වාගෙන යාමට දරන ලද සියලුම වියදම් වර්ෂයේ ආදායමෙන් අයකර තිබේ.

ආ) ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා, වියදම් ක්‍රමයේ ක්‍රියාකාරීත්වය ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි කාර්යසාධන අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව ජාතික සභා සාමාජිකයින්ගේ එකඟතාවය වන බැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කෙරේ.

3.4.3 මුදල් ප්‍රවාහය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි මුදල් ප්‍රවාහය ‘‘ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 02 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය’’ අනුව "වක්‍ර ක්‍රමය" භාවිතා කර ඉදිරිපත් කර ඇත.

4.0 බැඳීම් සහ අවිනිශ්චිතතාවයන්

අවිනිශ්චිතතාවයන් යනු අතීත සිදුවීමකින් පැන නගින වත්කම් හෝ බැඳීම් වන අතර ඒවා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි පාලනයෙන් ඔබ්බට ඇති අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු කරනු ලැබේ.

5.0 සභාවේ සාමාජිකයින්ගේ වගකීම් ප්‍රකාශ

මෙම මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් භාර ගනී.

6.0 අවසාන ගිණුම සඳහා අනුමැතිය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විසින් මෙම අවසන් ගිණුම 2024.02.16 දින පැවති ජාතික සභා රැස්වීමේදී අනුමත කර ඇත.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්
2023 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)	2023	2022	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
අතිරික්තය/(හිඟය)	147,747,119	81,537,169	* Restated
මුදල් නොවන අයිතම			
ක්ෂයවීම	469,176	551,972	
බොල් ණය සඳහා වෙන්කිරීම් වැඩිවීම	-	-	
ගෙවිය යුතු මුදල් වැඩිවීම	(158,700)	78,000	* Restated
ණයට ගැනීම් වැඩිවීම	-	-	
සේවක වියදම් සම්බන්ධ වෙන්කිරීම් වැඩිවීම	-	-	
දේපල,පිරියත හා උපකරණ විකිණීම මත (ලාභ) / පාඩු	-	-	
ආයෝජන විකිණීම මත (ලාභ) / පාඩු	-	-	
වෙනත් ජංගම වත්කම් වැඩිවීම්			
නැවත තක්සේරු කිරීම තුළ ආයෝජන වැඩිවීම	-	-	
ලැබියයුතු මුදල් වැඩිවීම	(149,749,459)	(76,612,050)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,691,864)**	**5,555,091**	
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පිරියත හා උපකරණ මිලටගැනීම	-	-	
පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබූ ආදායම	-	-	
ආයෝජන විකිණීමෙන් ලැබූ ආදායම	-	-	
විදේශ මුදල් සුරැකුම්පත් මිලටගැනීම	-	-	
ආයෝජන වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-**		
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-	
ණය ගැනීම් වලින් ලැබෙන ආදායම	-	-	
ණය ආපසු ගෙවීම්	-	-	
බෙදාහැරීම් / රජයට ලාභාංශ ලැබීම්	-	-	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-**	**-**	
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / අඩුවීම	**(1,691,864)**	**5,555,091**	
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන A)	10,763,309	5,208,219	
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන A)	**9,071,446**	**10,763,309**	
සටහන අ			
මුදල් හා මුදල් සමාන දෑ			
හිතකර ශේෂයන්			
NSPD ජංගම ගිණුම - BOC 2938104	3,625,278	9,834,598	
නිවාස ජංගම ගිණුම - BOC 7040561	5,446,168	928,711	
කේටි කාලීන ආයෝජන	-	-	
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	**9,071,446**	**10,763,309**	

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය
2023 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)	සටහන	2023	2022	
වත්කම්				
ජංගම වත්කම්				
ලැබිය යුතු මුදල් හා තැන්පතු	**01**	232,346,654	82,597,195	
මුදල් හා මුදල් සමාන දෑ	**02**	9,071,446	10,763,309	
		241,418,100	**93,360,504**	
ජංගම නොවන වත්කම්				
දේපල, පිරියත හා උපකරණ	**03**	2,658,666	3,127,842	
		2,658,666	3,127,842	
මුළු වත්කම්		**244076766**	**96,488,346**	
නිමිකම් සහ වගකීම්				
ජංගම වගකීම්				* Restated
වෙන්කිරීම්	**04**	158,700	317,400	(Note 12)
උපචිත වියදම්				
		158,700	317,400	* Restated
ජංගම නොවන වගකීම්				
මුළු වගකීම්		158,700	317,400	* Restated
ශුද්ධ වත්කම්		**243,918,066**	**96,170,947**	* Restated
ස්කන්ධ				* Restated
සමුච්චිත අතිරික්තය/(හිඟය)		243,918,066	96,170,947	(Note 12)
සංචිත				
ශුද්ධ නිමිකම		243,918,066	96,170,947	* Restated

ඉහතින් දක්වා ඇති 2023 දෙසැම්බර් 31 දිනට වන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය සහ ඒ සමග අමුණා ඇති අනෙකුත් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කරන ලද බවට සහතික වන්නෙමු.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ සියළු වගකීම් අප විසින් දරන්නෙමු

.....
යමුනා පෙරේරා

ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

.....
සභා සාමාජික

.....
ජයමාලි සී. වික්‍රමආරච්චි

අධ්‍යක්ෂ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

.....
සභා සාමාජික

සහතික කළේ,

අයි.එම්.අයි.සී.ඉලංකෝන්

ගණකාධිකාරි
ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික මහලේකම් කාර්යාලය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්

2023 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා *(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)*	සටහන	**2023**	**2022**
ආදායම	**05**	202,457,717	130,714,202
වෙනත් ආදායම්		-	-
		202,457,717	**130,714,202**
අඩුකළා : වියදම්			
සෘජු ප්‍රාග්ධන වියදම්	**06**	54,080,672	48,547,061
පරිපාලන සහ ආයතනික වියදම්	**07**	629,926	629,972
මුළු වියදම		**54,710,598**	**49,177,033**
මෙහෙයුම් වියදම් වලට වඩා ලැබූ ආදායම		**147,747,119**	**81,537,169**
අඩුකළා : මූල්‍ය සහ වෙනත් වියදම්		-	-
ශුද්ධ අතිරික්තය / (හිඟය) වෙනත් විස්තීර්ණ ආදායමට ඉදිරියෙන්		**147,747,119**	**81,537,169**
වෙනත් විස්තීර්ණ ආදායම්		-	-
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)		**147,747,119**	**81,537,169**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය
2023 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සමුච්චිත අරමුදල	එකතුව	
	රු. ශත	රු. ශත	
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**96,332,347**	**96,332,347**	
ගොඩනැගිලි වටිනාකම නැවත තක්සේරුකිරීම			
ඉඩම වටිනාකම නැවත තක්සේරුකිරීම			
පෙර වසරේ ගැලපීම (* නැවත සතස් කල, සටහන 12)	(161,400)	(161,400)	(සටහන 12)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය (ගලපන ලද)	96,170,947	96,170,947	
වසර තුළ ගැලපුම්			
කාලසීමාව සඳහා අතිරික්තය/(හිගය)	147,747,119	147,747,119	
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**243,918,066**	**243,918,066**	

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන
සටහන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා *(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)*		**2023**	**2022**
සටහන - 01 - ලැබිය යුතු මුදල් හා තැන්පතු			
සුපිරි වාසනා සම්පත ලොතරැයියෙන් ලැබිය යුතු මුදල		225,104,617	82,597,195
ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු මුදල - FD90309500		242,037	-
ස්ථාවර තැන්පතු - FD 90309752	¤	5,000,000	-
ස්ථාවර තැන්පතු - FD 90309500		2,000,000	-
		232,346,654	**82,597,195**
සටහන - 02 -මුදල් හා මුදල් සමාන දෑ **නිතකර ශේෂයන්**			
NSPD ජංගම ගිණුම- BOC 2938104		3625,278	9,834,598
නිවාස ජංගම ගිණුම - BOC 7040561		5,446,168	928,711
		9,071,446	**10,763,309**

සටහන - 03
දේපල, පිරියත හා උපකරණ

3.1 පිරිවැය	**01.01.2023** **දිනට ශේෂය**	**එකතුවීම්/** **මාරුකිරීම්**	**බැහැරකිරීම්/** **මාරුකිරීම්**	**31.12.2023** **දිනට ශේෂය**
කාර්යාලීය ගෘහ භාණ්ඩ	279,926	-	-	279,926
පර්ගණක සහ පරිගණක උපාංග	4,117,485	-	-	4,117,485
	4,397,411	**-**	**-**	**4,397,411**

3.2 ක්ෂයවීම්	**01.01.2023** **දිනට ශේෂය**	**වාර්ෂික** **ක්ෂය/** **මාරුකිරීම්**	**බැහැරකිරීම්/** **මාරුකිරීම්**	**31.12.2023** **දිනට ශේෂය**
කාර්යාලීය ගෘහ භාණ්ඩ	164,006	17,388	-	181,394
පර්ගණක සහ පරිගණක උපාංග	1,105,564	451,788	-	1,557,352
	1,269,569	**469,176**	**-**	**1,738,745**

3.3 ශුද්ධ පොත් අගය	**31.12.2023** **දිනට පිරිවැය**	**සමුච්චිත** **ක්ෂයවීම** **31.12.2023**	**ශුද්ධ** **අගය** **31.12.2023**
කාර්යාලීය ගෘහ භාණ්ඩ	279,926	181,394	98,532
පර්ගණක සහ පරිගණක උපාංග	4,117,485	1,557,352	2,560,133

4,397,411	1,738,745	2,658,666

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්
2023 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

සටහන - 03

දේපල, පිරියත සහ උපකරණ

3.3 ශුද්ධ පොත් අගය	**2023**	**2022**
පිරිවැයට		
කාර්යාලීය ගෘහ භාණ්ඩ	98,532	115,920
පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ	2,560,133	3,011,922
	2,658,666	**3,127,842**

සටහන - 04 - වෙන්කිරීම්

			* Restated
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	158,700	317,400	(Note 12)
	158,700	317,400	

සටහන -05 - ආදායම්

රාජ්‍ය ප්‍රදානයන්	34,000,000	31,880,000
සුපිරි වාසනා ප්‍රදානයන්	166,557,422	90,012,050
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා	629,178	2,575,000
වෙනත් ලැබීම්	1,029,079	6,247,152
ස්ථාවර තැන්පතු පොලිය - FD 90309500	242”037	-
	202,457,717	**130,714,202**

සටහන - 06 - සෘජු ප්‍රාග්ධන වියදම්

නිවාස ආධාර	19,530,494	12,509,425
ආධාරක උපකරණ	11,238,035	8,296,276
ජාත්‍යන්තර ආබාධිත දින සැමරුම (2023.12.01)	185,995	2,898,465
වෛද්‍ය ආධාර	9,750,568	11,338,291
ස්වයං රැකියා	5,119,819	4,091,560
අධ්‍යාපන ආධාර	5,371,266	4,344,169
කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන්	218,425	300,000
EMPO 2023	280,396	-
ප්‍රකාශන මුද්‍රණය හා වෙනත් මාධ්‍ය කටයුතු	99,000	-
ස්වයං-ආධාර ස්වේච්ඡා සංවිධාන	290,950	600,000
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා	629,178	2,750,130
ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - 1000	-	759,325
වෙනත් වියදම්	1,366,545	659,420
	54,080,672	**48,547,061**

සටහන - 07 - පරිපාලන හා ආයතනික වියදම්

කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම්	17,388	20,457
පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ ක්ෂයවීම්	451,788	531,516
විගණන ගාස්තු	158,700	78,000
බැංකු ගාස්තු	2,050	-
	629,926	**629,972**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්
2023 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා
(සියළුම අගයයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

සටහන -08 - හඳුනා නොගත් ගිවිසුම්ගත බැඳීම්
වාර්තා කරන දිනය වන විට කිසිදු බැඳීමක් නොනිබිණි
සටහන -09 -අවිනිශ්චිත බැදීම් සහ අවිනිශ්චිත වත්කම්
09.1 අවිනිශ්චිත වත්කම්
වාර්තා කරන දිනය වන විට කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිත වත්කමක් නොපැවතිණි

09.2 අවිනිශ්චිත බැදීම්
වාර්තා කරන දිනය වන විට දැක්වීමට කිසිදු ද්‍රව්‍යමය අවිනිශ්චිත බැදීමක් නොතිබුණි
සටහන - 10 වාර්තා කරන දිනට පසුව සිදු වන සිදුවීම්

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශන දිනයේ සිට මූල්‍ය ප්‍රකාශන සමග ගැලපීම් සිදුකළ යුතු හෝ හෙළිදරව් කළයුතු තත්වයේ කිසිදු තත්වයක් පැන නැගී නොමැත.

සටහන - 11 - අදාල පාර්ශ්වයයන් සමග ගනුදෙනු
ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය එහි ජාතික සභාවේ සාමාජිකත්වය එහි ප්‍රධාන කළමණාකාරීත්වය ලෙස සලකනු ලබයි

2023 වසර තුළ ප්‍රධාන කළමණාකාරීත්වය සමග හෝ ඔවුන්ගේ පවුල්වල සමීප සාමාජිකයින් සමග හෝ LKAS 24- අදාල පාර්ශ්වයයන් සමග ගනුදෙනු - යටතේ හෙළිදරවු කළ යුතු ආකාරයේ කිසිදු ගනුදෙනුවක් සිදු වී නොමැත

සටහන - 12 - පෙර වසර ගැලපීම්
විගණන ගාස්තු ගිණුම සඳහා වෙන්කිරීම් ශේෂය නිවැරදි කිරීම
ජාතික විගණන කාර්යාලයේ තහවුරු කිරීම්වලට අනුව, 2021 හා 2022 විගණන ගාස්තුව සඳහා වැඩියෙන් දරා ඇති ප්‍රතිපාදන පහත පරිදි වේ.

	රු. ශත
2021 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ඌණ වෙන් කිරීම (රු.158,700.00-රු.78,000.00)	80,700
2022 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ඌණ වෙන් කිරීම (රු.158,700.00-රු.78,000.00)	80,700
	161,400

2022 වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන් කිරීම	රු. ශත
2022 මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	156,000
විගණන ගාස්තු සඳහා ඌණ වෙන්කිරීම් සඳහා ගැලපීම්	161,400
2022 මූල්‍ය ප්‍රකාශන සඳහා නැවත සකස්කරන ලද ශේෂය	317,400

2022 සමුච්චිත අරමුදල් ගිණුම	රු. ශත

2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය	96,332,347
විගණන ගාස්තු ඌණ වෙන්කිරීම් සඳහා ගැලපීම්	(161,400)
2022 මූල්‍ය ප්‍රකාශන සඳහා නැවත සකස්කරන ලද ශේෂය	96,170,947

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

ජනල් සටහන්

2023 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

දිනය	විස්තරය	වවුවර් අංකය	හර	බැර
1/1/2023	සමුච්චිත අරමුදල - හර		80,700	
	විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම්			80,700
	(විගණන ගාස්තු වෙන්කිරීම් නිවැරදි කිරීම - 2021)			
1/1/2023	සමුච්චිත අරමුදල - හර		80,700	
	විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම්			80,700
	(විගණන ගාස්තු වෙන්කිරීම් නිවැරදි කිරීම - 2022)			
1/1/2023	NSPD ජංගම ගිණුම - BOC 2938104 -හර		9,834,598	
	නිවාස ජංගම ගිණුම - BOC 7040561-හර		928,711	
	පරිගණක හා පරිගණක ආශ්‍රිත උපකරණ -පිරිවැය-හර		4,117,485	
	කාර්යාලීය ගෘහ භාණ්ඩ - පිරිවැය -හර		279,926	
	සුපිරි වාසනා ලොතරැයියෙන් ලැබිය යුතු මුදල -හර		82,597,195	
	පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ - සමුච්චිත ක්ෂයවීම්			1,105,564
	කාර්යාලීය ගෘහ භාණ්ඩ - සමුච්චිත ක්ෂයවීම්			164,006
	විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම්			317,400
	2022.12.31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය			96,170,947
	(පෙර වසරේ ශේෂයන් ඉදිරියට ගෙන ඒම)			
12/31/2022	කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම්-හර		17,388	
	කාර්යාලීය ගෘහ භාණ්ඩ - සමුච්චිත ක්ෂයවීම්			17,388
	(කාර්යාල ගෘහ භාණ්ඩවල වාර්ෂික ක්ෂයවීම් වාර්තා වීම)			
12/31/2022	පරිගණක සහ පරිගණක උපකරණ ක්ෂයවීම්-හර		451,788	
	පරිගණක සහ පරිගණක ආශ්‍රිත උපකරණ - සමුච්චිත ක්ෂයවීම්			451,788
	(පරිගණක සහ තොරතුරු තාක්ෂණ උපකරණවල වාර්ෂික ක්ෂයවීම් වාර්තා කිරීම)			
	ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ලැබීම් (FD 90309500) හර		242,037	
	ස්ථාවර තැන්පතු පොලී (FD 90309500)			242,037
	(2023 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී වාර්තා කිරීම)			
12/31/2022	විගණන ගාස්තු හර		158,700	

	විගණන ගාස්තුව සඳහා වෙන්කිරීම්			158,700
	(2023 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන් කිරීම)			

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

ජනල් සටහන්
2023 දෙසැම්බර් 31 න් අවසන් වන වර්ෂය සඳහා

දිනය	විස්තරය	වවුවර් අංකය	හර	බැර
12/31/2023	රජයෙන් ආධාර ලැබීම්-හර		34,000,000	
	සුපිරි වාසනා සම්පත ආධාර ලැබීම්-හර		166,557,422	
	ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා-හර		1,442,000	
	වෙනත් ලැබීම්-හර		1,029,079	
	ස්ථාවර තැන්පතු පොලී ලැබීම් - FD 90309500		242,037	
	නිවාස ආධාර			19,530,493
	ආධාරක උපකරණ			11,238,035
	ජාත්‍යන්තර ආබාධිත දිනය (2023.12.01)			185,995
	EMP- 2023			280,396
	වෛද්‍ය ආධාර			9,750,568
	ස්වයං රැකියා			5,119,819
	අධ්‍යාපන ආධාර			5,371,266
	කුසලතා සංවර්ධන හා පුහුණු වැඩසටහන්			218,425
	ස්වයං-ආධාර ස්වෙච්ඡා සංවිධාන			290,950
	ආබාධිත පුද්ගලයින් සවිබලගැන්වීමේ වැඩසටහන - රැකියා			1,442,000
	ප්‍රකාශන මුද්‍රණය හා වෙනත් මාධ්‍ය කටයුතු			99,000
	වෙනත් වියදම්			1,366,545
	කාර්යාලීය ගෘහ භාණ්ඩ ක්ෂයවීම්			17,388
	පරිගණක සහ පරිගණක උපාකරණ ක්ෂයවීම්			451,788
	විගණන ගාස්තු			158,700
	බැංකු ගාස්තු			2,050
	සමුච්චිත අරමුදල			147,747,119
	(ආදායම් සහ වියදම් සමුච්චිත අරමුදලට මාරු කිරීම වාර්තා කිරීම)			

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එඒඩබ්/ඩී/එන්එස්පීඩී/එෆ්එස්/2023

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 මැයි 21 දින

19 JUN 2024

ඝනාපති

ආඛාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය

ආඛාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනා සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද පැතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මූදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කරන ලද රු.5,000,000 ක් වූ ස්ථාවර තැන්පතු සඳහා වර්ෂයට අදාළ රු.1,021,574 ක් වූ පොලී පාදායම ලැබිය යුතු ආදායම් ලෙස හිණුම්ගත

ගනුකිරීම් හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම් හා ලැබිය යුතු දෙපාර්තමේන්තු ආදායම් අඩුවෙන් දක්වා තිබුණු අතර රු.2,000,000 ක් වූ ත්‍රෛමාසික ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොලිය රු.211,744 ක් වුවත් රු.242,037 ක් වශයෙන් ගිණුම් ගත කිරීම් හේතුවෙන් රු.30,293 කින් වර්ෂයේ ආදායම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මහලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් සඳහා දරන ලද වැටුප් වියදම් වෙනත් පායතන වියදම් දැරීම හේතුවෙන් මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි තත්වයක් පිලිඹිබු නොවේ. ඒ අනුව වාර්ෂික වැටුප් වියදම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 127 ඡේදය ප්‍රකාරව සටහන් යටතේ හෙලිදරව් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්. මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මහලේකම් කාර්යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ දැතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මහලේකම් කාර්යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ දැතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම් වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් පාකාරයකින් ලබාගත් මගේ දැනුම් අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.
මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි වලස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.
මහලේකම් කාර්යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම

කරුණු පත්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ඵාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ඡංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක යාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මහලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මහලේකම් කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මහලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මහලේකම් කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා පැතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් පැනිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරීක්ෂකයන් විසින් ගනු ලබන අරමුණක තීරණ කෙරෙහි වන බලපෑම ඉහ රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පැනි විය හැකි ප්‍රමාණාත්මක ඍවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවිය ප්‍රමාණාත්මක ඍවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම ඉහිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද නිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, නිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මහලේකම් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිණුම්කරණය සඳහා භාවිතයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු සතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මහලේකම් කාර්යාලය සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික කන්වයෙන් බැහැරව සම්බන්ධයක් පැති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට මහලේකම් කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති/ විධානයට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(අ) මූදල් රෙගුලාසි 756	මහලේකම් කාර්යාලය සතු රු.2,658,666 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.
(ආ) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 15 වගන්තිය	කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හා සේවකයින් සඳහා සේවක ජර්ථ සාධක දායක මූදල් ප්‍රතිලාභ ලබාගත හැකි පරිදි බඳවා ගැනීම හෝ 16 (1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවයේ නිලධාරීන් හෝ පත්කල හැක. ඒ සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රජයේ ස්ථිර නිලධාරීන්

බදවා ගැනීම් සඳහා කාර්යමණ්ඩලයේ සහතුරු 67 ක් අනුමත කර තිබුණි. නමුත් මේ සඳහා බඳවාගැනීමේ පටිපාටිය පිළිපයල කර අනුමැතිය හෝ බඳවාගැනීම් සිදු කර නොතිබුණි. රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් 46 දෙනෙකු හා සමාජසේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 03 දෙනෙකුත් කාර්යමණ්ඩලය ලෙස මහලේකම් කාර්යාලයේ කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණි. මේ සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් 25 දෙනෙකු වෙනුවෙන් වාර්ෂික වැටුප් සඳහා අමාත්‍යාංශය විසින් රු. 15,430,524 ක් ද, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 3 දෙනෙකු සඳහා රු. 2,347,260 ක් ද ගෙවා තිබුණ එතර නිලධාරීන් 21 දෙනෙකු වෙනුවෙන් වැටුප් ගෙවීම් පිළිබඳව නොරතුරු ආයතනය සතුව නොපැවතුණි

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහ ලේකම් කාර්යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නීරීක්ෂණ හැර මහ ලේකම් කාර්යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රයෝජනය කර භාවිතා කර නොමැති බව.

(අ) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වන වගන්තියේ (උ) වගන්තිය ප්‍රකාරව ආබාධවලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැනගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම හා (ඒ) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වා ගෙන යාම කලයුතු වුවත් අදාළ කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් හා කාර්යක්ෂම පියවර ගෙන නොතිබුණි. තවද පනතේ (ඕ) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ට නැවතිමේ පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනීම් සඳහා ආයතන පිහිටුවා පවත්වා ගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තිය පුහුණුව ලබා දීම හා පනතේ (ක) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ට නැවතිම් පහසුකම් සැපයීමේ ආයතන පිහිටුවීම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තිය පුහුණුව ලබාදීමට රජය පූර්ගලයන් දිරිමත් කිරීම කලයුතු වුවද අදාල කාර්යයන් සිදුකර නොතිබුණි.

(ඟ) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පාරක්ෂා කිරීමේ පනතේ I වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවා තිබුණි. 2023 වර්ෂයේදී ජාතික සභාව විසින් ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම, ආබාධිතත්ව කළමනාකරණ තොරතුරු පද්ධතිය (DMIS) සැකසීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම, අතුළත් ගත් ලැබූ වැදගත් නිරණ ක්‍රියාත්මක කිරීමට මේ දක්වා නොහැකි වී තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට ලැබිය යුතු මුදල රු. 82,597,195 ක් වුවත් 2023 වර්ෂයේදී ඉන් ලැබී තිබුණේ රු. 24,050,000 ක් පමණි. මෙම මුදලෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබා දීමේ වැඩසටහන් යටතේ 2023 වර්ෂය තුළදී ප්‍රතිලාභීන් 241 දෙනෙකු වෙත රු.22,980,493 ක් නිවාස ආධාර ලෙස ලබා දී තිබුණි. ඒ අනුව නිවාස ආධාර විශයෙන් වර්ෂය තුල ලැබුණු මුදල හෝ සම්පූර්ණයෙන් ආධාර ලබා දීම් සඳහා යොදවා නොතිබුණි. තවද 2023 වර්ෂයට අදාලව සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් කිසිදු මුදලක් ජාතික මහලේකම් කාර්යාලයට ලැබී නොතිබුණු පසර සම්මාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.225,104,617 ක් විය. මේ හේතුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණ නිසියාකාරව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) ආබාධ සහිත තැනැත්තන්ට සමාන අවස්ථා ලබාදීම, සවිබල ගැන්වීම, සුභසාධනය හා සුභ සිද්ධිය උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සම්මානාත්මනාවයකින් යුතුව ලබාදීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක විශයෙන් ව්‍යාප්තිය, වයස් ව්‍යුහය , ආබාධිත තත්ත්වය, ආර්ථික තත්ත්වය හඳුනාගැනීම හා නිශ්චික, නිවැරදි හා ඵලදායී තීරණ ගැනීම සඳහා ආබාධිත ප්‍රජාවගේ කොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයේදී ජාතික සභාවේදී වාර 04 කදී පමණ සාකච්ඡාවට ලක් කෙරුණු බස්නාහිර, දකුණ, මධ්‍යම සහ උතුර යන පළාත් 04 ආවරණය වන පරිදි රැකවරණ මධ්‍යස්ථාන 04 ක් ස්ථාපිත කිරීම වෙනුවට දකුණු පළාතේ අකුරැස්ස ප්‍රදේශයේ පමණක් මූල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ඉදිකරනු ලැබූ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය 2023 ජුනි 27 දින ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණ නමුත් මේ දක්වා මෙම මධ්‍යස්ථානය භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව ඒහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සම්බන්ධ පිළිතුරු

1.4.2 මහලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් සඳහා දරන ලද වැටුප් වියදම වෙනත් ආයතන විසින් දැරීම හේතුවෙන් මහලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුලින් නිවැරදි තත්වයක් පිළිබිඹු නොවේ. ඒ අනුව වාර්ෂික වැටුප් වියදම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 127 ඡේදය ප්‍රකාරව සටහන් යටතේ හෙලිදරව් කර නොතිබුණි.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය කාන්තා, ළමා කටයුතු හා සමාජසවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අංශයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් එහි සියළුම නිලධාරීන්ට වැටුප් ගෙවනු ලබන්නේ එම අමාත්‍යාංශය මගිනි. එය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම මගින් ගිණුම්ගත කරන බැවින් ඒ සම්බන්ධ තොරතුරු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ ගිණුමට ඇතුළත් නොකරන ලදී. නමුත් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි 2024 වර්ෂයේ සිට වාර්ෂික වැටුප් වියදම සටහනක් ලෙස හෙලිදරව් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.

1.4.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දී රු.5,000,000 ක ස්ථාවර තැන්පත් ලෙස ආයෝජනය කර තිබුණ අතර වර්ෂයට අදාළ රු.1,021,574 ක් වූ පොලී ආදායම ලැබිය යුතු පොලී ආදායම ලෙස ගිණුම් ගත නොකිරීම හේතුවෙන් ඒම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු පොලී ආදායම අඩු අඩුවෙන් දක්වා තිබුණු අතර රු.2,000,000 ක් වූ ත්‍රෛයිමාසික ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ පොලිය රු.211,744 ක් වුවත් රු.242,037 ක් වශයෙන් ගිණුම් ගත කිරීම හේතුවෙන් රු.30,293 කින් වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

2023.02.20 දින රු.5,000,000 ක් ස්ථාවර තැන්පතුවක් ලෙස දින 400 ක කාලසීමවක් සඳහා ආයෝජනය කරන ලදී. එය කල් පිරී ඇත්තේ 2024.03.26 දිනය. එනම් ගිණුමට අදාළ කාලයට සහ ගිණුම ඉදිරිපත් කරන ලද දිනයට පසුවය. යම් අවශ්‍යතාවයක් සඳහා දින 400 කට වඩා අඩු කාලයකින් ස්ථාවර තැන්පතුව උපලබ්ධි කිරීමට අවශ්‍ය වුවහොත් ලැබෙන්නේ ස්ථාවර තැන්පතුව සඳහා අදාළ වන පොලිය වඩා බොහෝ අඩු පොලියකි. එනිසා ඒ සඳහා ලැබිය යුතු පොලිය අවිනිශ්චිත බැවින් බැංකුව වෙතින් ලිඛිතව

2023.12.31 දිනට සියළුම ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය පිළිබඳව විමසීමේ දී ඊට පිළිතුරු ලෙස ලිඛිතව දැනුම් දී ඇති පොලිය (ත්‍රෛමාසික තැන්පතු සඳහා) පමණක් 2023 වර්ෂය සඳහා ලැබිය යුතු පොලිය ලෙස ගිණුම්ගත කරන ලදී. මේ වන විට අදාළ පොලිය ලැබී ඇති අතර 2024 වර්ෂය සඳහා ගිණුම් සකස් කිරීමේ දී එම පොලිය ගිණුම් ගත කරන බව කාරුණිකව සඳහන් කරමි. එමෙන්ම ලංකා බැංකුව මගින් 2023.12.31 දිනට ලැබිය යුතු පොලිය ලෙස ලිඛිතව දැනුම් දෙන ලද පොලිය ගිණුම්ගත කරන ලදී. බැංකුව වෙතින් විමසා බැංකු පොලිය මත රඳවා ගැනීමේ බදු ආපසු අයකරගැනීමට කටයුතු කර 2023 වර්ෂයට අදාල පොලිය සංශෝධනය කළ යුතු වන්නේ නම් සංශෝධනය කර 2024 වර්ෂයේ ගිණුම සංශෝධනය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

1.5 (අ) මහ ලේකම් කාර්යාලය සතු රු.2,658,666 ක් වූ ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ සියළු ස්ථාවර වත්කම් පිළිබඳව අමාත්‍යාංශය විසින් මු.රෙ. 756 ප්‍රකාරව පරීක්ෂා කර ඇත.

(ආ) **කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හා සේවකයින් සඳහා සේවක අර්ථ සාධක දායක මුදල් ප්‍රතිලාභ ලබාගත හැකි පරිදි බඳවා ගැනීම් හෝ 16 (1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවයේ නිලධාරීන් හෝ පත්කළ හැක. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රජයේ ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම සඳහා කාර්ය මණ්ඩලයේ තනතුරු 67 ක් අනුමත කර තිබුණි. නමුත් මේ සඳහා බඳවාගැනීමේ පටිපාටි පිළියෙල කර අනුමැතිය හෝ බඳවාගැනීම් සිදු කර නොතිබුණි. රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් 46 දෙනෙකු හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 03 දෙනෙකුත් කාර්ය මණ්ඩලය ලෙස මහලේකම් කාර්යාලයේ කාර්යයන් සඳහා යොදවා තිබුණි. මේ සඳහා අමාත්‍යාංශයෙන් නිලධාරීන් 25 දෙනෙකු වෙනුවෙන් වාර්ෂික වැටුප් සඳහා අමාත්‍යාංශය විසින් රු.15,430,524 ක් ද, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 3 දෙනෙකු සඳහා රු.2,347,260 ක් ද ගෙවා තිබුණ අතර නිලධාරීන් 21 දෙනෙකු වෙනුවෙන් වැටුප් ගෙවීම් පිළිබඳව තොරතුරු ආයතනය සතුව නොපැවතුණි.**

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සංස්ථාපිත ආයතනයක් වශයෙන් පිහිටුවා රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින බව සඳහන් කරමින් ඉදිරිපත් කරන ලද 2021 විගණන විමසුම 2022.06.28 දින පැවැති ජාතික සභාව වෙත

ඉදිරිපත් කළ අතර ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යලය තවදුරටත් අමාත්‍යාංශයේම අංශයක් ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් නොවීය. ඒ අනුව තවදුරටත් අමාත්‍යාංශයේ ම අංශයක් වශයෙන් ක්‍රියාත්මක වීම නිසා මහලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් සඳහා කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය විසින් දල වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් 24 දෙනා සඳහා ද වැටුප් ගෙවනු ලබනුයේ කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය විසිනි. කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/B1/41/03 දරණ 2022 අගෝස්තු 08 දිනැති ලිපියෙන් සමාජ සේවා නිලධාරීන් තිදෙනෙකු සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

3.1 (අ) 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වන වගන්තියේ (උ) වගන්තිය ප්‍රකාරව ආබාධවලට ප්‍රධාන හේතු මොනවාදැයි සොයා දැනගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායී පියවර ප්‍රවර්ධනය කිරීම හා (එ) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම කලයුතු වුවත් අදාල කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් හා කාර්යක්ෂම පියවර ගෙන නොතිබුණි. තව ද පනතේ (ඔ) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තතන්ට නැවතීමේ පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තතන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දීම හා පනතේ (ක) වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සැපයීමේ ආයතන පිහිටුවීම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබාදීමට රජය පුද්ගලයන් දිරිමත් කිරීම කලයුතු වුවද අදාල කාර්යයන් සිදුකර නොතිබුණි.

අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙහි දෙවන අදියර ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට සැලසුම් සකස් කර ඇත. එහෙත් පවත්නා ආර්ථික අර්බුදය හමුවේ ප්‍රතිපාදන ලබා ගැනීමට අපහසුතාවයක් පැවතීම හේතුවෙන් නව මධ්‍යස්ථාන පිහිටුවීම අපහසුවී ඇත. මෙම අමාත්‍යාංශය යටතේම සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන, පූර්ව වෘත්තීය කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා රැකවරණ මධ්‍යස්ථාන හරහා ආබාධ සහිත තැනැත්තන් සහ ආබාධ සහිත දරුවන් සඳහා සේවා සපයනු ලබයි.

මෙම අමාත්‍යාංශය යටතේ ඇති සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් වයස අවු 16- 45 අතර ආබාධ සහිත දරුවන් සඳහා නැවතීමේ පහසුකම් ලබා දීම, ආහාර පාන ලබාදීම හා ඔවුන් රැකබලාගැනීම සඳහා ආයතන පිහිටුවා ඔවුන්ට වෘත්තීය පුහුණුව ද ලබා දෙනු ලබයි. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ මෙවැනි වෘත්තීය පුහුණු ආයතන දිවයිනම ආවරණය වන පරිදි 11 ක් පිහිටුවා ඇති අතර වයස අවු. 01 – 05 ත් අතර ආබාධ සහිත දරුවන් සඳහා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවා ඔවුන්ට චිකිත්සක ප්‍රතිකාර ලබා දෙනු ලබන අතරම පෙර පාසැල් අධ්‍යාපනය ලබා දෙනු ලබයි.

අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙහි දෙවන අදියර ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට සැලසුම් සකස් කර ඇත.

රැකවරණ මධ්‍යස්ථාන 06 ඉදිකළ පසු ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සැලසීමද රැකබලා ගැනීම හා අවශ්‍ය පුහුණු ලබා දීම ද සිදු කළ හැකි වනු ඇත. අකුරැස්ස පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් අවසන් කර ඇත. දෙවන අදියර ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත. මෙම අමාත්‍යාංශය යටතේ වන සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් වෘත්තීය පුහුණු ආයතන 11 ක් මඟින් ආබාධ සහිත තැනැත්තන් සඳහා නැවතීමේ පහසුකම් සලසා දෙමින් ඔවුන් රැකබලා ගන්නා අතරම වෘත්තීය පුහුණුව ලබා දෙනු ලබයි. සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් කාන්තාවන් සඳහා බටුගම්මන රැකවරණ මධ්‍යස්ථානයක් ද පිරිමින් සඳහා පුවක්පිටිය රැකවරණ මධ්‍යස්ථානයක් ද පවත්වාගෙන යනු ලබයි.

දැනට ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙහි ලියාපදිංචි වී ඇති ස්වෙච්ඡාවෙන් කරගෙන යනු ලබන රැකවරණ හා පුනරුත්ථාපන ආයතනවල ප්‍රමිතියේ තත්ත්වය වැඩි දියුණු කිරීමට අවශ්‍ය මැදිහත්වීම් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) **1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 1 වන කොටසේ 2 වන වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික සභාවක් පිහිටුවා තිබුණි. 2023 වර්ෂයේ දී ජාතික සභාව විසින් ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම, ආබාධිතත්ව කළමනාකරණ තොරතුරු පද්ධතිය (DMIS) සැකසීම, ආබාධ සහිත තැනැත්තන් සඳහා**

සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම ඇතුළුව ගනු ලැබූ වැදගත් තීරණ ක්‍රියාත්මක කිරීමට මේ දක්වා නොහැකි වී තිබුණි.

I ආබාධ සහිත භාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම

මේ වන විට ජාතික ක්‍රියාකාරී සැලැස්ම කෙටුම්පත් කර ඇති අතර එයට සමගාමීව ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමත් කළ යුතු බැවින් එය ඉටු කර ගැනීමට United Nations Partnership on the Rights of Persons with Disabilities (UNPRPD) ආයතනය සමඟ සාකච්ඡා කර ඇති අතර උපදේශකවරයෙකුගේ සහය ලබාගෙන ප්‍රතිපත්තිය සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට UNPRPD ආයතනය සහයෝගිතාවය ලබා දීමට එකඟතාවය එලකර ඇත. ඒ අනුව 2024 වර්ෂය තුළ ආබාධ සහිතභාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කිරීමට නියමිතය.

ii ආබාධිතත්ව කළමනාකරණ තොරතුරු පද්ධතිය (DMIS) සැකසීම

තොරතුරු පද්ධතියක් සකස් කිරීම සඳහා ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ කිහිප අවස්ථාවක්ම සාකච්ඡා කර ඇත. ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේ සිදු කරනු ලබන සංගණනයට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු ලබා දීමට එකඟ වී ඇත.

සමාජ සේවා දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා ආකෘති පත්‍රයක් සකස් කර සිදුකරන සමීක්ෂණ හරහා ලබා ගන්නා දත්ත හා එකී තොරතුරු ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සමඟ බෙදා ගැනීමට නියමිතය.

iii ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම

ආබාධ සහිත තැනැත්තන් සඳහා සුදුසු රක්ෂණ ක්‍රමවේදයක් සඳහා යෝජනාවලියක් සකස් කර රාජ්‍ය හා පෞද්ගලික රක්ෂණ ආයතන වෙත දැනටමත් යොමු කර ඇත. ඔවුන්ගෙන් මේ සඳහා ප්‍රතිචාර නොලැබූ බැවින් සියලු ආයතන සමග සාකච්ඡාවක් සිදු කිරීමට නියමිතය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව අතර ආබාධ සහිත තැනැත්තන් උදෙසා රක්ෂණයක් ලබා දීම සම්බන්ධව සාකච්ඡාවක් පැවැත්විණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික අරමුදලට ලැබිය යුතු මුදල රු. 82,597,195 ක් වුවත් ඉන් 2023 වර්ෂයේ දී රු.24,050,000 ක් පමණක් ලබා දී තිබුණි. ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර ලබා දීමේ වැඩසටහන් යටතේ 2023 වර්ෂය තුළදී ප්‍රතිලාභීන් 241 දෙනෙකු වෙත රු. 22,980,493 ක් නිවාස ආධාර ලෙස ලබා දී තිබුණි. ඒ අනුව නිවාස ආධාර වශයෙන් වර්ෂය තුල ලැබුණු මුදල හෝ සම්පූර්ණයෙන් ආධාර ලබා දීම සඳහා යොදවා නොතිබුණි. තව ද 2023 වර්ෂයට අදාළව සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් කිසිදු මුදලක් ජාතික මහලේකම් කාර්යාලයට ලැබී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.225,104,617 ක් විය. මේ හේතුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිවාස ආධාර වැඩසටහනේ අරමුණු පෙර වර්ෂයේ දී මෙන්ම නිසියාකාරව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

මහා භාණ්ඩාගාරය වෙත මුදල් ලබාදෙන ලෙස ඉල්ලුම් කරමින් 2023.02.03, 2023.03.08, 2023.04.30, 2023.08.31 2023.09.08 දිනැතිව වරින් වර ලිපි යොමු කරනු ලැබීය. මීට අමතරව ප්‍රමාණවත් පරිදි මුදල් ලබා ගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු නිලධාරින් සමඟ සාකච්ඡා කරන ලදී. මිය යාම, පදිංචිය හැර යාම, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, නිවාස සංවර්ධන අධිකාරිය හා ස්වෙච්ඡා ආයතන ආදී ආයතන මගින් නිවාස තනා දීම නිවාස ආධාර ප්‍රතික්ෂේප කිරීම ආදී හේතූන් මත නිවාස ආධාර ප්‍රතික්ෂේප වී නැවත එවීම් රු.මි. 1.05 කට ආසන්න විය. ආපසු එවීම්වලින් ලැබුණු මුදල් ඇතුළුව 2023 වර්ෂයේ ඉතිරි මුදලින් මේ වන විට නිවාස ආධාර ලබා දී ඇත. 2024 වර්ෂයේ ජුනි 30 දින වන විට රුපියල් මිලියන නවයක් ලැබී ඇති අතර එමඟින් නිවාස ආධාර ලබාදීම ආරම්භ කර ඇත.

(ඇ) ආබාධ සහිත තැනැත්තන්ට සමාන අවස්ථා ලබාදීම, සවිබල ගැන්වීම, සුභසාධනය හා සුභ සිද්ධිය උදෙසා වැඩ සටහන් හා ව්‍යාපෘති ජාතික මට්ටමින් විනිවිදභාවයකින් හා විධිමත් ලෙස ප්‍රතිලාභ සමානාත්මතාවයකින් යුතුව ලබා දීමට පහසුවන පරිදි ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ සංඛ්‍යාව හා දිස්ත්‍රික්ක වශයෙන් ව්‍යාප්තිය, වයස් ව්‍යුහය, ආබාධිත තත්ත්වය, ආර්ථික තතත්වය හඳුනාගැනීම හා නිශ්චිත නිවැරදි ඵලදායී තීරණ ගැනීම සඳහා ආබාධිත ප්‍රජාවගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි.

දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සංඛ්‍යාත්මක තොරතුරු ලබා දීමට එකඟ වී ඇත. සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන සමීක්ෂණය මඟින් එකී තොරතුරු ලබා ගැනීමට ද සාකච්ඡා කර එකඟ වී ඇත.

(ඇ) 2023 වර්ෂයේ දී ජාතික සභාවේදී වාර 04 කදී පමණ සාකච්ඡාවට ලක් කෙරුණු බස්නාහිර, දකුණ, මධ්‍යම සහ උතුර යන පළාත් 04 ආවරණය වන පරිදි රැකවරණ මධ්‍යස්ථාන 04 ක් ස්ථාපිත කිරීම වෙනුවට දකුණු පළාතේ අකුරැස්ස ප්‍රදේශයේ පමණක් මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ඉදිකරනු ලැබූ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය 2023 ජුනි 27 දින ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත භාර දී තිබුණු නමුත් මේ දක්වා මෙම මධ්‍යස්ථානය භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි.

ලෝක බැංකු ආධාර යටතේ ගොඩනැගිල්ල ඉදිකළ නමුත් එය පවත්වාගෙන යාමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ප්‍රතිපාදන ලබා ගැනීමට අපහසු වූ බැවින් ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය යටතේ අවශ්‍ය ප්‍රතිපාදන ලබාගන්නා ලදී. එමඟින් ගෘහභාණ්ඩ, උපකරණ කොටසක් මේ වන විට මිලදීගෙන ඇති අතර චිකිත්සක උපකරණ ඇණවුම් කර ඇති අතර 2024.07.15 දිනට පෙර ඒම උපකරණ ලැබීමට නියමිතය. අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා බඳවා ගැනීම් පරිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2024.02.26 දින අනුමැතියට ඉදිරිපත් කර ඇත. කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් අනතුරුව මෙහි රාජකාරී ආරම්භ කිරීමට නියමිතය.

ජයමාලි සී වික්‍රමආරච්චි

අධ්‍යක්ෂ

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය